සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

# ක්‍රිස්තු ධර්මය

07 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

**I කොටස**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ස්නාවක ජොහාන් තුමාගේ අති විශේෂ මෙහෙය ගැන පවසා ඇති දිවැසිවරයා වන්නේ,

(1) එසකියල් තුමා ය. (2) යෙසායා තුමා ය.

(3) ජෙරමියා තුමා ය. (4) ආමොස් තුමා ය.

02. 'සියල්ල නිම විය.' මෙම ප්‍රකාශය ජේසුස් වහන්සේ කුරුසියේ දී ප්‍රකාශ කළ,

(1) පළමු වචනය ය. (2) හතරවන වචනය ය.

(3) හයවන වචනය ය. (4) හත්වන වචනය ය.

03. ජේසුස් වහන්සේ උත්ථාන වූ බව ස්පර්ශ කිරීමෙන් විශ්වාස කළ ගෝලයා වන්නේ,

(1) ජාකොබ් තුමා ය. (2) තෝමස් තුමා ය.

(3) ජොහාන් තුමාය. (4) ජූදස් තුමා ය.

04. ජුදෙව් පාස්කු මංගල්‍යයට දින කීයකට පසු පෙන්තකොස්ත මංගල්‍යය සමරනු ලබන්නේ ද?

(1) දින 40 කට පසු. (2) දින 20 කට පසු.

(3) දින 10 කට පසු. (4) දින 50 කට පසු.

05. සුදර්ශන දොරටුව අසල දී සුවය ලැබුවේ,

(1) අංශභාග රෝගියෙකි. (2) ලාදුරු රෝගියෙකි.

(3) උපන් දා පටන් කොර වූ රෝගියෙකි. (4) ගොළු බිහිරි රෝගියෙකි.

- **අංක 06 සිට 10 දක්වා දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

06. දේව මැවිල්ල සුරැකීම මිනිසා සතු ප්‍රධාන වගකීමකි. ( )

07. පරිසිවරු හා සද්දුසිවරු ස්නාවක ජොහාන් තුමාගේ වදන් පිළිගන්නා ලදී. ( )

08. "නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න." මෙම ප්‍රකාශය ජේසුස් වහන්සේ තමන්ට පැමිණි දෙවන පරීක්ෂාවට දුන් පිළිතුරයි. ( )

09. කිතුනු ජීවිතයේ පදනම ඇදහිල්ලයි. ( )

10. කන්ද උඩ දේශනයෙන් අපගේ ජීවිත වලට වටිනා ආදර්ශ ලබා ගත හැකි ය. ( )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට A කොටසේ දැක්වෙන වගන්ති හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | මැවීම ගැන සඳහන් වන පොත | ප්‍රේම කරන්න. |
| 12. | ජේසුතුමා නිරාහාරව සිටි දින ගණන | නිහතමානි කම |
| 13. | පෙන්තකොස්ත දින දේශනය කළේ | හතළිහකි |
| 14. | ඔබේ අසලප්වැසියා ට | උත්පත්ති |
| 15. | ස්නාවක ජොහාන් තුමා සතු ගුණාංගයකි | පේදුරුතුමාය |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නව වල දැක්වෙන ප්‍රකාශ වල හිස්තැනට වරහන තුළ දී ඇති පිළිතුර යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.**

( ක්‍රියා / දේව වචනය / යාච්ඤා / මිනිසාට / ප්‍රඥාවේ )

16. දේව මැවිල්ලේ විශේෂ තැනක් ........................................ හිමි වේ.

17. දේව ගරු බිය පෑම යනු ........................................ උල්පත ලෙස හැඳින්වේ.

18. ජේසුස් වහන්සේ පරීක්ෂාවන්ට නොබියව මුහුණ දුන්නේ ........................................ තුළිනි.

19. පෙන්තකොස්ත සිද්ධිය පිළිබඳව විස්තර සඳහන් වන්නේ ........................................ පොතෙහි ය.

20. ඔබට පීඩා කරන්නන් උදෙසා ........................................ කරන්න.

(ලකුණු 20 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව <u>තවත්</u> ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) අද සමාජය තුළ දරුවන්ට එල්ල වන පීඩා 02 ක් ලියන්න.

(ii) ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා තෝරාගත් ස්ථාන 02 ක් ලියන්න.

(iii) "රන්වන් රිදී මට නැත'' මේසේ පැවසුවේ කවුද? කාටද?

(iv) දේව නිර්මාණයේ අඛණ්ඩ පැවැත්මට උදාහරණ 02 ක් ලියන්න.

(v) පවුලක් තුළ තිබිය යුතු කිතුනු ගුණාංග 2 ක් ලියන්න.

(vi) ස්නාවක ජොහාන් තුමා ආහාරයට ගත් දේවල් 2ක් ලියන්න.

(vii) කිතුනු දරුවෙක් ලෙස සමාජයට ආලෝකයක් වීමට ඔබට කළ හැකි දේවල් 02 ක් ලියන්න.

(viii) නැති වූ බැටළුවා පිළිබඳ උපමාවට අනුව ''බැටළුවා'' සහ එඬේරා ලෙස හඳුන්වන්නේ කවුද?

(ල. 2 x 8 = 16)

02. (i) පෙන්තකොස්ත දිනයේදී සිදුවූ විශේෂ සිදුවීම 02 ක් ලියන්න. (ල. 02)

(ii) මුල් කිතුනු සභාවේ ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබට ලැබී ඇති ශුද්ධාත්ම දීඝනා 03ක් නම් කර එය සභාවේ දියුණුවට යොදා ගන්නා ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 06)

03. (i) ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීමට ආසන්න සිදුවීම් 02 ක් ලියන්න. (ල. 02)

(ii) අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේ විසින් සිදු කළ කාර්යය කුමක් ද? එම සිද්ධියට විරුද්ධ වූ ගෝලයා කවුද? (ල. 03)

(iii) ඔබ ඔබේ මවට/ පියාට යහපත් දරුවෙකු ලෙස කටයුතු කරන ආකාරය කරුණු 3 ක් ලියන්න.(ල. 06)

04. (i) අද සමාජය මුහුණ පාන ස්වාභාවික විපත් 2 ක් ලියන්න. (ල. 02)

(ii) කොරෝනා වසංගතයට මුහුණ දී සිටින ඔබේ අසල්වැසියකු වෙනුවෙන් කළ හැකි උපකාර 3 ක් ලියන්න. (ල. 03)

(iii) විපත්තියකට මුහුණ දී සිටින ඔබේ යහළුවෙකු වෙනුවෙන් කළ හැකි කෙටි යාච්ඤාවක් ලියන්න. (ල. 06)

05. (i) ජේසුස් වහන්සේගේ කාලයේ ජුදා සමාජයේ කොන් කළාවූ ජන කොටස් 2 ක් ලියන්න. (ල. 02)

(ii) ''ළඳරුවන් මා වෙත එන්න ඉඩ හරින්න. ඔවුන් වළක්වන්න එපා'' මෙම ප්‍රකාශය කළේ කවුද? කාටද? කුමන අවස්ථාවේද? (ල. 03)

(iii) පන්තියේ කොන් වී සිටින අයෙක් වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් 3 ක් ලියන්න. (ල. 06)

06. (i) මේරි ජෝන්ස් බයිබලයක් ලබා ගැනීමට මුදල් එකතු කර ගැනීමට කළ දේවල් 02 ක් ලියන්න (ල. 02)

(ii) මුල් කාලයේ ශුද්ධ ලියවිලි ලියැවී තිබූ දේවල් 03 ක් ලියන්න. (ල. 03)

(iii) ශුද්ධ බයිබලය කියවීම තුළින් ඔබට ලැටබන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (2) 02. (3) 03. (2) 04. (4) 05. (3) 06. (✓) 07. (X) 08. (✓) 09. (✓) 10. (✓)

11. උත්පත්ති 12. හතළිහකි 13. පේදුරුතුමා 14. ප්‍රේම කරන්න 15. නිහතමානිකම

16. මිනිසාට 17. ප්‍රඥාවේ 18. දේව වචනය 19. ක්‍රියා 20. යාච්ඤා

(ල. 2 x 20 = 40)

## II කොටස

01. (i) දුප්පත්කම/ දෙමාපිය සබඳතා දෙදරා යාම/ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම/ යුද්ධය නිසා අසරණ වීම / ස්වාභාවික විපත් නිසා අනාථ වීම/ මව පියා විදේශ ගත වීම .......

(ii) කඳු මුදුන් / මිටියාවත් / මුහුදු වෙරළ

(iii) පේදුරු සහ ජොහන් විසින් කොරව සිටි රෝගියාට

(iv) වැස්ස ඇතිවීම/ බිත්තරයකින් පැටවෙක් බිහිවීම/ දිවා රෑ ඇති වීම/ නව දරු උපත්/ බීජයකින් පැළයක් හට ගැනීම .......

(v) ආදරය / රැකවරණය / පරිත්‍යාගය / සමාව දීම .....

(vi) පළගැටියන් සහ වන මී

(vii) බෙදා ගැනීම/ සමාව දීම/ අවශ්‍යතා වලදී උදව් කිරීම/ සමානාත්මතාවය/ සවන් දීම .....

(viii) බැටළුවා - කිතුනු අපි

එඬේරා - ජේසුස් වහන්සේ (ල. 2 x 8 = 16)

02. (i) සැඩ සුළඟක් හැමීම/ ගිනි දලු වැනි දිව්/ අන්‍ය භාෂා වලින් කථා කිරීම .... (ල. 02)

(ii) ඉගැන්වීම/ සහභාගිතම/ රොටි කැඩීම/ යාච්ඤාව සියල්ල පොදුවේ තබා ගැනීම. (ල. 03)

(iii) ප්‍රේමය, ඉවසිලිවන්තකම, කරුණාව, සමාව දීම ආදි ශුද්ධාත්මඵල ලියා ඒවා සභාවේ දියුණුවට යොදා ගන්නා ආකාරය ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 06)

03. (i) අන්තිම රාත්‍රි භෝජනය/ ශ්‍රාවකයින්ගේ පාද සේදීම/ ගෙත්සෙමනෙහි යාච්ඤාව (ල. 02)

(ii) ශ්‍රාවකයින්ගේ පාද සේදීම

සීමොන් පේදුරු (ල. 03)

(iii) කීකරු වීම/ උදව් උපකාර කිරීම/ ප්‍රිය වදනින් කථා කිරීම/ ආදරයෙන් රැක බලා ගැනීම (ල. 06)

04. (i) සුනාමි / සුළි සුළං/ භූමි කම්පා/ නියඟ / ගංවතුර (ල. 02)

(ii) මුදල් ආධාර ලබා දීම, ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම, ආදරයෙන් කථා කිරීම ..... (ල. 03)

(iii) ලියා ඇති යාච්ඤාවට ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. (i) කාන්තාවන්/ දරුවන්/ රෝගින්/ දිළිඳුන්/ අයකැමියන් (ල. 02)

(ii) ජේසුස් වහන්සේ විසින් ගෝලයන්ට

මව්වරු තම දරුවන් ආශිර්වාද කර ගැනීමට ජේසු තුමා වෙත පැමිණි අවස්ථාවේ

ගෝලයන් මව්වරුන්ට තරවටු කළ විට (ල. 03)

(iii) ආදරයෙන් පිළිගැනීම/ අවශ්‍යතා වලදී උදව් කිරීම/ නොදන්නා පාඩම් කියා දීම .....

ලියා ඇති කරුණු වලට ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (i) දර එකතු කර විකිණීම/ බිත්තර විකිණීම/ මී මැසි පට්ටියක් නඩත්තු කිරීම/ කෑම කන්න දුන්න සල්ලි එකතු කිරීම (ල. 02)

(ii) පැපිරස් පත්‍ර වල / පදම් කළ හම් වල / ගල් පුවරු වල (ල. 03)

(iii) දේව මග පෙන්වීම ලැබීම

ජීවිතය නිවැරදිව පවත්වාගෙන යාම.

ජේසු ගැන දැන ගැනීමට හැකි වීම ආදි ලියා ඇති කරුණු වලට ලකුණු ලබා දෙන්න. (ල. 06)